# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1717/15 - 2011 අගෝස්තු 03 වැනි බදාදා - 2011.08.03**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින් මෙම නියෝගය මගින් :—

*(අ)* ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කටයුතුවල පරිපාලනය බරපතල ලෙස අවුල් වී ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසු 2011 ජූලි මස 21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉහත කී විශ්වවිද්‍යාල පනත හෝ ඒ යටතේ සාදන ලද වෙනත් යම් නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් ප්‍රකාර ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ සහ කිරීමේ කාර්යය සඳහා ඉහත කී විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් නිසි බලධරයා වශයෙන් නිමල් රංජිත් අර්ථනායක මහතා පත් කරමි; සහ

*(ආ)* 20 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ සාදන ලද සහ 2011 ජූලි මස 20 වැනි දින දරන අංක 1715/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය පරිච්ඡින්න කරමි.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2011 ජූලි මස 21 වැනි දින,
කොළඹ දී ය.

08 - 458


1A - G 14866—835 (2011/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.